දිවි තොර කරගැනීම් වාර්තා කිරීම් ඔස්සේ සිදුවිය හැකි අනුකාරක සිදුවීම් සිදුවිය හැකි බව පර්යේෂණ මඟින් පෙන්වා දෙයි. එය වර්දර් බලපෑම (Werther effect) ලෙසින් ද හැඳින්වේ. එවැනි අනුකාරක දිවි තොර කරගැනීම් අවම කිරීම උදෙසා, දිවි තොර කරගැනීම් වාර්තාකරණය වෙනුවෙන් හඳුන්වා දී ඇති මාධ්‍ය මාර්ගෝපදේශයන් පිළිපැදීම අත්‍යාවශ්‍ය වේ.
කෙසේ නමුත්, තවමත් ඇතැම් මාධ්‍ය මේ සම්බන්ධයෙන් වගකීම් සහගත නොවීම කණගාටුවට කරුණකි. ඊට නිදසුන් ලෙස, දිවි තොර කරගැනීම් සම්බන්ධයෙන් අප්‍රේල් 04, 2023 දින සිංහල භාෂා පුවත්පත් කිහිපයක පළ වූ පුවත් වාර්තාවන් පෙන්වා දිය හැක.
මාධ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව දිවි තොර කරගැනීම් වාර්තා කිරීම තුළින්, තවත් එක් ජීවිතයක් හෝ බේරාගැනීම මාධ්‍ය අත රැඳි සමාජ වගකීමක් බව මෙසේම අවධාරණයෙන් සඳහන් කරමු.
උපකාරක අංකයක් සඳහන් කරමු, ජීවිතයක් රැකගනිමු!
හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)
(මෙම දිවි තොර කරගැනීම් සම්බන්ධිත පුවත්, එදින මෙම පුවත්පත් වල සහෝදර ඉංග්‍රීසි භාෂා පුවත්පත් තුළ පළ වී නැත.)

